සිඒ/6/1/2/05-11 2024.07.25

බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය චක්‍රලේඛ අංක - සං.ප්‍ර. 2024/02

සියලුම සංස්කෘතික මධ්‍යස්ථානභාර නිලධාරීන් වෙත

# අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිභා සංගීත/නර්තන/ චිත්‍ර තරගාවලිය

## චිත්‍ර චක්‍රලේඛය - 2024

### හැඳින්වීම

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින් වාර්ෂිකව පවත්වනු ලබන මෙම තරගය ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථානවල දැනුම ලබන දරුදැරියන්ගේ නිර්මාණ කුසලතා සංවර්ධනය කිරීමට එලි දැක්වීමට හා උසස් අධ්‍යාපනයට යොමු වීමේ දී ප්‍රමුඛතාවයක් ලබා දීමේ අරමුණ පෙරදැරිව ක්‍රියාත්මක වේ.

### අරමුණු

01. දෘශ්‍ය කලා රසවින්දනය වර්ධනය කිරීම.

02. වින්දනය හා විචාර හැකියාව වර්ධනය කිරීම.

03. අනාගත ලෝකයට පූර්ණ පෞරුෂයකින් යුතු පුරවැසියෙකු බිහි කිරීම.

04. නිර්මාණාත්මක චින්තනය හා පරිකල්පනය වර්ධනය කිරීම.

### උපදෙස්

1. ඉදිරිපත් වන සෑම තරගකරුවෙක්ම තරගය පවත්වන දිනය වන විට සංස්කෘතික මධ්‍යස්ථානයේ ලියාපදිංචි වී අවම වශයෙන් මාස තුනක් ඉක්මවා තිබිය යුතුය.

2. තරග පැවැත්වෙන ආසන්නයේ තරගය සඳහාම බඳවා ගන්නා සිසුන් හෝ වෙනත් ආයතනයක සිසුන් ඉදිරිපත් කිරීම සම්පූර්ණයෙන්ම තහනම්ය.

3. ප්‍රතිභා තරගාවලිය සඳහා සිසුන් ඉදිරිපත් කිරීමේ දී මධ්‍යස්ථානවල ලියාපදිංචි වී නොමැති සිසුන් ඉදිරිපත් කර ඇති බව අනාවරණය වුවහොත් අදාල මධ්‍යස්ථානය තරගයෙන් ඉවත් කිරීමට ක්‍රියා කරන අතර ව්‍යාජ තොරතුරු සැපයීම මත මධ්‍යස්ථාන නිලධාරීන්ට විනයානුකූලව කටයුතු කරනු ඇත. එමෙන්ම තරග අවලංගු කරන ලද මධ්‍යස්ථානයකට ශූරතාවය හෝ අනුශූරතාවය ද අහිමිවනු ඇත.

4. ප්‍රතිභා තරගාවලිය පළාත් මට්ටමේ තරග හා ජාතික තරග ලෙස අදියර දෙකක් වශයෙන් පවත්වන අතර, පළාත් තරගයේ දී එක් එක් තරග ශීර්ෂයන් හි පළමු, දෙවන හා තෙවන ස්ථානය පමණක් ජාතික තරගය සඳහා සුදුසුකම් ලබන අතර, ජාතික තරග පැවැත්වෙන දින හා ස්ථාන පිළිබඳව පසුව දැනුම් දීමට කටයුතු කරනු ඇත.

5. තරග විනිශ්චය සඳහා චක්‍රලේඛය සමග යාකර ඇති ලකුණු ලබා දීමේ පටිපාටිය උපයෝගී කර ගනු ලැබේ.

6. නියමිත දිනට පසුව එවන ලද චිත්‍ර කිසිදු හේතුවක් මත භාරගනු නොලැබේ.

7. කිසිදු තරගයකට ඉදිරිපත් නොවූ සංස්කෘතික මධ්‍යස්ථානයන්හි සම්පත්දායක දීමනා අත්හිටුවීමට කටයුතු කරනු ලැබේ.

8. පළාත් වටය සඳහා චිත්‍ර තෝරා ගැනීමේ දී මධ්‍යස්ථාන චිත්‍ර තරගය 2024 අගෝස්තු මස 03 දින ඒ ඒ සංස්කෘතික මධ්‍යස්ථානවල දී පැවැත්වීමට කටයුතු කළ යුතුය.

9. තරගය පෙ.ව. 9.00 සිට ප.ව. 12.00 ද දක්වා ප.ව. 1.00 සිට ප.ව. 4.00 දක්වා වූ පැය 06 ක ප්‍රමාණවත් කාලයක් ලබා දී චිත්‍ර නිර්මාණ අවසන් කළ යුතුය.

10. ආදර්ශ අයදුම් පත්‍රය සමඟ මධ්‍යස්ථාන මට්ටමින් තෝරා ගත් චිත්‍ර 2024 අගෝස්තු මස 18 වන දිනට ප්‍රථම අමාත්‍යාංශයේ ප්‍රවර්ධන අංශයට එවීමට කටයුතු කරන්න.

11. චක්‍රලේඛය සම්බන්ධයෙන් /තරගාවලිය සම්බන්ධයෙන් යම් ගැටළුවක් ඇති වුවහොත් ඒ පිළිබඳව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ හෝ බලය පැවරූ අතිරේක ලේකම්ගේ (ප්‍රවර්ධන) තීරණය අවසන් තීරණය වේ. එම තීරණ අභියෝගයට ලක් කළ නොහැකිය.

**තරග කොන්දේසි**

- මෙම තරගය සියලුම මධ්‍යස්ථාන ස්ථානභාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන් ගේ අධීක්ෂණය සහ මධ්‍යස්ථාන චිත්‍ර සම්පත්දායකයන්ගේ උපදේශකත්වයෙන් හා ඔබ විසින් තෝරා ගනු ලබන චිත්‍ර විෂයේ ප්‍රවීනයකු ගෙන් සමන්විත 3 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් තෝරා ඒ ඒ තරග කාණ්ඩ යටතේ තෝරාගත් ජයග්‍රාහී චිත්‍ර නිර්මාණ 5 බැගින් පළාත් ජයග්‍රහණය සඳහා ඉදිරිපත් කළ යුතුය.

- එම නිර්මාණ සමඟ චක්‍රලේඛයේ දක්වන ලද ආදර්ශ අයදුම්පත තරගකරුවන් විසින් සම්පූර්ණ කර එවිය යුතුය.

- මධ්‍යස්ථානවල තරග පැවැත්වීමේ දී බලය පවරන ලද අමාත්‍යාංශ නිලධාරීන් අහඹු ලෙස අධීක්ෂණයට පැමිණිය හැකි බැවින්; අප ලබාදුන් දිනයන් හා වේලාවන් වෙනස් නොකළ යුතු බවද අවධාරණය කෙරේ.

- සම්පූර්ණ කරන ලද අයදුම්පත චිත්‍රයේ පිටු පස අලවා එවීමට කටයුතු කළ යුතුවේ.

- එක් තරගකරුවෙකුට තෝරාගත් මාතෘකාව යටතේ එක් නිර්මාණයක් පමණක් ඉදිරිපත් කළ හැකිය.

- ඉදිරිපත්වන සෑම තරගකරුවෙකුම සංස්කෘතික මධ්‍යස්ථානයේ ලියාපදිංචි වූ අයෙක් විය යුතු අතර, ඒ බව චක්‍රලේඛය සමඟ එවන අයදුම්පතෙහි ස්ථානභාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරි විසින් සහතික කළ යුතු වේ.

- සංස්කෘතික මධ්‍යස්ථාන දෙකක ලියාපදිංචි වී ඇති අයදුම්කරුවන් සිටී නම් තරග සඳහා ඉදිරිපත් විය හැකිවනුයේ එක් සංස්කෘතික මධ්‍යස්ථානයකින් පමණි.

- සමස්ථ තරගාවලියේම ලබා ගන්නා ස්ථානයන් පාදක කර ගනිමින් ලබා දෙන ලකුණු අනුව වැඩිම ලකුණු ප්‍රතිශතය ලබා ගන්නා සංස්කෘතික මධ්‍යස්ථානය සඳහා ශූරතාවයද දෙවන මට්ටමේ ලකුණු ප්‍රතිශතය ලබා ගන්නා සංස්කෘතික මධ්‍යස්ථානය සඳහා අනුශූරතාවයද හිමි වේ.

**ත්‍යාග හා සහතික පත්**

- පළාත් මට්ටමින් ජාතික තරගයට තෝරා ගනු ලබන චිත්‍ර නිර්මාණ අතුරින් සෑම අංශයකින්ම පළමුවන, දෙවන සහ තෙවන ස්ථාන සඳහා සහතික පත් පිරිනැමෙන අතර, ප්‍රථම ස්ථානය සඳහා ලකුණු 80 වැඩියෙන් ලබා ගන්නා ප්‍රථම ස්ථානයට පමණක් පදක්කම් පිරිනැමෙයි. තවද සෑම අංශයකින්ම කුසලතා 05ක් සඳහා සහතික පත් පිරිනැමෙයි.

**තරග අංශ**

චිත්‍ර තරගය පහත දැක්වෙන ලෙස වයස් කාණ්ඩ 4 කින් යුක්ත වේ.

| **අනු අංකය** | **තරග කාණ්ඩය** | **වයස** |
|---|---|---|
| 01 | ප්‍රාථමික අංශය | අවු. 11 ට අඩුවිය යුතුය (2013.07.01 දින හෝ ඊට පසු යෙදිය යුතුය |
| 02 | කණිෂ්ඨ අංශය | අවු.11-15 අතර (උපන් දිනය 2009.06.30 සිට 2013.06.30 දක්වා) |
| 03 | ජ්‍යෙෂ්ඨ අංශය | අවු.15-20 අතර (උපන් දිනය 2004.06.30 සිට 2009.06.29 දක්වා |
| 04 | විවෘත අංශය | වයස් සීමාවක් නොමැත |

- 2024 වර්ෂයේ ජුනි මස 30 දිනට අදාළ වයස ගණනය කරනු ලැබේ.
- විවෘත කාණ්ඩය යටතේ චිත්‍ර තරගය සඳහා මධ්‍යස්ථාන සම්පත්දායකයාට ඉදිරිපත් වීමේ අවස්ථාව ඇත.
- තේමාවේ නිර්මාණශිලී ප්‍රකාශනය සඳහා අවශ්‍ය වන සියලුම ද්‍රව්‍ය හා උපකරණ තරගකරු විසින් සපයා ගත යුතු වේ.

**මාධ්‍යය**

- පැස්ටල්
- දිය සායම්
- මිශ්‍ර මාධ්‍යය
- කොලාජ් ආදී ඕනෑම වර්ගයක් භාවිතා කළ හැකිය.

**ප්‍රමාණය**

- සියලුම නිර්මාණ අගල් 18×14 ප්‍රමාණයෙන් විය යුතු අතර, භාවිතා කරන මාධ්‍ය අනුව සුදුසු කඩදාසි වර්ගයක් භාවිතා කළ හැකිය.

**තරග අංග සඳහා තේමා**

**ප්‍රාථමික අංශය**

- දුවමු පනිමු අපි සෙල්ලම් කරමු එකතු වී
- කුරුලු අම්මයි කුරුලු තාත්තයි කුරුලු පැටවුන්ට කෑම ගෙනත්
- මේ පෙරහැරේ ලස්සන
- මෝස්තර පිරිණු සරුංගලේ ඉහළ නගින හැඩ

**කණිෂ්ඨ අංශය**

- කය වෙහෙසා පාරේ වැඩ කරන වටිනා මිනිසුන්
- මගේම චිත්‍රයේ මගේම මූණ
- මුව රංචුවම වතුර බොන්න ඇවිත්
- "හෝයියා හෝයියා" මාදැල අදිමු වෙර යොදා

**ජ්‍යෙෂ්ඨ අංශය**

- ඒ වේදනාබර සමුගැනීම
- කුඹුරේ වැඩකර මදකට වෙහෙස නිවාගමු හෙවනක
- නොසිතු නොපැතු ඒ අනපේක්ෂිත මොහොත
- පාර තනන තැන - වෙහෙසෙන මිනිසුන්

**විවෘත අංශය**

- වර්ණ හා හැඩතල වලට හැඟීම් ඇත
- නර්තන රිද්මයක දෘශ්‍ය ප්‍රකාශනය
- වෙහෙසෙන මිනිසුන්ගේ මානව සිරුරේ රිද්මය
- වේදිකා නාට්‍යයක චරිත අතර බාහිර අභ්‍යන්තර ගැටුමේ උද්වේගකර අවස්ථාවක්

**අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන ජාතික චිත්‍ර තරගාවලිය 2024**

**01.ප්‍රාථමික අංශය**

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | මානව රූප හා සත්ව රූප ඇතුලු සියලුම හැඩතල තලය මත සංවිධානය කර ඇති අයුරු | 20 |
| 02 | හැඩතලවල නිර්මාණාත්මක බව | 20 |
| 03 | වර්ණ භාවිතයේ දක්වා ඇති කුසලතාවය | 20 |
| 04 | අව්‍යාජ හැඟීම් ප්‍රකාශණය කිරීමේ හැකියාව | 20 |
| 05 | සමස්ත නිමාව | 20 |

02. කණිෂ්ඨ අංශය

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | තෝරා ගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේ දී ඊට උචිත වාතාවරණය හා පරිසර තත්වය ප්‍රකාශ කිරීම | 20 |
| 02 | මානව රූප හා සත්ව රූප ඇතුලු සියලුම හැඩතල  සංවිධානය කර ඇති අයුරු | 20 |
| 03 | හැඩතල පරිනත බව | 20 |
| 04 | වර්ණ භාවිතයේ දක්වා ඇති කුසලතාවය | 20 |
| 05 | සමස්ත  නිර්මාණශීලී නිමාව | 20 |

03. ජ්‍යෙෂ්ඨ/විවෘත අංශය

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | තෝරා ගත් මාතෘකාව ප්‍රකාශ කිරීම සඳහා විවිධ අවස්ථාව, හැඩතල සංරචනය කිරීමේ සිද්ධාන්ත භාවිතය | 20 |
| 02 | මාතෘකාවට ගැලපෙන හැඩතල ගොඩනැගීමේ පරිනත බව හා නිර්මාණාත්මක බව | 20 |
| 03 | වර්ණ භාවිතා කිරීමේ ශිල්පීය කුසලතාවය | 20 |
| 04 | මාතෘකාවට ගැලපෙන උචිත වාතාවරණය හා පරිසර තත්වය ප්‍රකාශ කිරීම | 20 |
| 05 | හැගීම්,සමාජ ප්‍රකාශනය හා නිර්මාණශීලී බව හා සමස්ත නිමාව | 20 |



**තිලක් නන්දන හෙට්ටිආරච්චි**

අතිරේක ලේකම් (සංස්කෘතික ප්‍රවර්ධන)

**අත් /කළේ එච්. එම්. බී. පී. හේරත්**

ලේකම්,

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

# ප්‍රතිභා 2024
# අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන
# පළාත් ජාතික චිත්‍ර තරගාවලිය

**අයදුම්කරුගේ විස්තර**

01. සම්පූර්ණ නම (සිංහලෙන් ) :- ------------------------------------------------------------------------

ඉංග්‍රීසියෙන් :- ------------------------------------------------------------------------

02. ලිපිනය :- ------------------------------------------------------------------------

03. ස්ත්‍රී/පුරුෂ බව :- ------------------------------------------------------------------------

04. උපන් දිනය :- ------------------------------------------------------------------------

05. 2024.06.30 දිනට වයස :- ------------------------------------------------------------------------

06. ඉදිරිපත් වන තරග අංශය :- ------------------------------------------------------------------------

07. මාතෘකාව :- ------------------------------------------------------------------------

08. ලියාපදිංචි අංකය :- ------------------------------------------------------------------------

**සංස්කෘතික මධ්‍යස්ථාන විස්තර**

09. සංස්කෘතික මධ්‍යස්ථානයේ නම :- ----------------------------------------------------------------

10. සංස්කෘතික මධ්‍යස්ථානයේ ලිපිනය :- ----------------------------------------------------------------

11. දුරකථන අංකය මධ්‍යස්ථානය :- ----------------------------------------------------------------

පෞද්ගලික :- ----------------------------------------------------------------

12. සංස්කෘතික මධ්‍යස්ථානය අයත් වන

01.ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :- ----------------------------------------------------------------

02.දිස්ත්‍රික්කය :- ----------------------------------------------------------------

03.පළාත :- ----------------------------------------------------------------

13 චිත්‍ර නිර්මාණ පුහුණු කළ ගුරු භවතුන්ගේ නම් අත්සන

----------------------------------------------- ----------------------------------

ඉහත නම් සඳහන් අයදුම්කරු විසින් දක්වන ලද සියලුම තොරතුරු නිවැරදි බවත් මේ සමඟ තරගයට ඉදිරිපත් කරන චිත්‍රය ඔහු/ඇය විසින් මාගේ අධීක්ෂණය යටතේ නිර්මාණය කළ බවත් සහතික කරමි.

ස්ථානභාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීගේ නම අත්සන

-------------------------------------------- ---------------------------

දිනය :- -------------------

නිල මුද්‍රාව